# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ශ්‍රී සීලානන්ද පදනම (සංස්ථාගත කිරීමේ)

**ශ්‍රී සීලානන්ද පදනම සංස්ථාගත කිරීම සඳහා වූ**
**පනත් කෙටුම්පතකි**

---

මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වීරසුමන වීරසිංහ මහතා විසින්
2022 ඔක්තෝබර් මස 19 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2022 ඔක්තෝබර් මස 10 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[157 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල :** රු. 12.00 **තැපැල් ගාස්තුව :** රු. 15.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී සීලානන්ද පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

**පූර්විකාව**

"ශ්‍රී සීලානන්ද පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව ඒ පදනමේ පරමාර්ථ හා ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද;

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය**

1. මේ පනත 2022 අංක      දරන ශ්‍රී සීලානන්ද පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**ශ්‍රී සීලානන්ද පදනම සංස්ථාගත කිරීම**

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන්පසුව (මෙහි මින්මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී සීලානන්ද පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු බඳවා ගනු ලබන සියලු තැනැත්තන් (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් හඳුන්වනු ලබන) "ශ්‍රී සීලානන්ද පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය භාවිතා කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. එකී සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද, එකී නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි ය.

**සංස්ථාවේ පොදු පරමාර්ථ**

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ කවර පරමාර්ථ සඳහා ද, ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) රටේ සමාජයීය, සංස්කෘතික හා ආර්ථික සංවර්ධනයට සහභාගි වීම;

(ආ) ජනතාවගේ විනය හා සංස්කෘතික සාරධර්මයන් ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා විධිවිධාන සැලැස්වීම;

(ඈ) ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම සඳහා ආධාර ලබාදීම;

(ඇ) කාන්තාවන් හා ළමුන්ගේ සියලුම අයිතීන් ආරක්ෂා කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියා කිරීම; සහ

(ඉ) ශ්‍රී ලංකාව තුළ ජීවත් වන සියලුම ජාතීන්ට සමගියෙන්, අභිවෘද්ධියෙන් හා සහජීවනයෙන් ජීවත් වීමට අවශ්‍ය සියලු උපදෙස් හා ආධාර ලබාදීම.

**සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම**

**4.** (1) සංස්ථාවේ කටයුතු, සභාපති, ලේකම්, භාණ්ඩාගාරික ඇතුළු සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන එකොළොස් දෙනකුගෙන් සමන්විත වූ කළමනාකරණ කමිටුවක් විසින් මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ සංස්ථාවේ තත් කාලයේ පවත්නා රීතිවලට යටත්ව කළමනාකරණය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ කමිටුව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ සංවිධානයේ කළමනාකරණ කමිටුවේ සාමාජිකත්වය දැරුවා වූ තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

**සංස්ථාවේ සාමාන්‍ය බලතල**

**5.** බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදානයන් හා පරිත්‍යාග භාරගැනීමේ සහ එකතු කිරීමේ ද, අරමුදල් කරගැනීමේ ද, සංස්ථාවේ මුදල් ආයෝජනය කිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීමේ, සේවයේ නියුක්ත කිරීමේ, සේවයෙන් පහකිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ එහි යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු හෝ දේවල් ඉටු කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාවේ යෙදවීමේ බලය මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවට ඇත්තේ ය.

**පදනමේ රීති**

**6.** (1) සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත දැක්වෙන සියලුම කරුණු හෝ ඉන් කිසිවක් හෝ සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය;—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, අස්කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම;

(ආ) ධුර දරන්නන් තෝරාපත් කර ගැනීම, ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ධුරය හිස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම ඔවුන්ගේ බලතල, චර්යාව සහ වගකීම;

(ඇ) කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම සහ එහි බලතල, කාර්යය, චර්යාව සහ කළමනාකරණ කමිටුවේ සාමාජිකයන්ගේ ධුර කාලයන්;

(ඈ) සංස්ථාවේ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන්ගේ චර්යාව, කාර්ය, කර්තව්‍ය සහ බලතල;

(ඉ) කළමනාකරණ කමිටුවේ රැස්වීම්වල දී පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම කැඳවීම සහ පැවැත්වීම, කාලවේලාවන්, ස්ථානයන්, එම රැස්වීම පිළිබඳ දැන්වීම සහ න්‍යාය පත්‍ර, එම රැස්වීම්වල ගණපූරණය සහ එම රැස්වීම්වල දී සාකච්ඡා කළ යුතු කාරණා;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම සහ එකී අරමුදල්වල භාරකාරත්වය, ගිණුම් පවත්වාගෙන යාම සහ විගණනය; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එකී පරමාර්ථ මුදුන්පත් කර ගැනීම.

(2) (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබූ ආකාරයටම සහ එවැනිම වූ රැස්වීමක දී සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, එකතු කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

පදනම විසින් ගෙවිය යුතු සහ පදනමට අයවිය යුතු ණය

**7.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයෙහි සංවිධානයේ පැවති සියලු ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට සංවිධානයට අයවිය

යුතු සියලු ණය සහ ලැබිය යුතුව තිබූ සම්මාදම් මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා ගෙවනු ලැබිය යුතු ය.

පදනමේ අරමුදල

8. (1) පදනමට එහිම අරමුදලක් තිබිය යුතු අතර ත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, ප්‍රදාන, පරිත්‍යාග, සාමාජික මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ආධාර මුදල් වශයෙන් මින් පෙර හෝ මින්මතු සියලු මුදල් සංස්ථාවේ අරමුදල් වෙනුවෙන් කළමනාකරණ කමිටුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි එක් බැංකුවක හෝ බැංකු වැඩි සංඛ්‍යාවක, සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ බලතල, කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන සියලු වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් භාර අරමුදලින් ගෙවිය යුතු ය.

පදනම විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව

9. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් මගින් හෝ අන්‍යාකාරයකින් පදනම වෙත සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් බලය හා හැකියාව ඇති අතර, එකී සියලු දේපළ මේ පනතේ විධිවිධාන සහ සංස්ථාවේ 06 වන වගන්තිය යටතේ සාදන ලද රීතිවලට යටත්ව එකී දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ ඒ දේපළ අන්‍යාකාරයකින් නීයාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ

10. පදනම විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු කවර හෝ දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ පදනමේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, පදනමේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ ගිණුම් සහ විගණනය

11. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම්, සභාව තීරණය කරන පරිදි සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන් -

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරි ආයතනයක එක් එක් නේවාසික හවුල්කරු, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරි ආයතනයක්,

අදහස් වේ.

**12.** සංස්ථාවේ මුද්‍රාව සංස්ථාවේ කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, කවර වූ හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එකී තැනැත්තන් විසින් ඔවුන් පැමිණ සිටින බවට සලකුණක් වශයෙන් එකී සාධනපත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු අතර, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව

**13.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය. ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

**14.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව